# බස්නාහිර පළාත් තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය

බස්නාහිර පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා කළා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ අමාත්‍යාංශය

# පුරප්පාඩු තනතුරු

බස්නාහිර පළාත් තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරියෙහි පවත්නා පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| තනතුර | සුදුසුකම් සහ පළපුරුද්ද | වැටුප් පරිමාණය |
|---|---|---|
| **ජාල පරිපාලක**<br>**( NETWORK ADMINISTRATOR )**<br>**( පුරප්පාඩු 01)** | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පරිගණක විද්‍යාව / තොරතුරු තාක්ෂණ විද්‍යාව විෂයයක් සහිතව උපාධියක් ලබා තිබීම<br>**හෝ**<br>පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම<br>**හෝ**<br>අවම වශයෙන් තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාතික වෘත්තීය යෝග්‍යතා (NVQ) 7 වෙනි මට්ටම හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ඒ හා සමාන වෙනත් සුදුසුකමක් ලබා තිබීම.<br>**සහ**<br>උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක, සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ අවුරුදු 02 ක වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම. | JM 1 - 1- 2016 - ( රු. 42,600/- - 10 x 755/- - 18 x 1,135/- - 70,580/- )<br>මූලික වැටුප් තලය - 2020.01.01<br>රු. 42,600/- + ජී. වි. දීමනාව |
| **ජ්‍යෙෂ්ඨ උපදේශක**<br>**( SENIOR INSTRUCTOR - Application Software & Graphic Designing )**<br>**(පුරප්පාඩු 01)** | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පරිගණක විද්‍යාව / තොරතුරු තාක්ෂණික විද්‍යාව විෂයයක් සහිතව උපාධියක් ලබා තිබීම සහ පරිගණක ක්ෂේත්‍රයේ අවුරුදු 03 ක වෘත්තීය පළපුරුද්ද ලබා තිබීම.<br>**හෝ**<br>පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම සහ පරිගණක ක්ෂේත්‍රයේ අවුරුදු 02 ක වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.<br>**හෝ**<br>අවම වශයෙන් තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාතික වෘත්තීය යෝග්‍යතා (NVQ) 7 වෙනි මට්ටම හෝ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ඒ හා සමාන වෙනත් සුදුසුකමක් සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ අවුරුදු 03 ක වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම. | MA 4 - 2016 - ( රු. 37,970/- - 10 x 755/- - 15 x 930/- - 5 x 1,135/- - 65,145/- )<br>මූලික වැටුප් තලය - 2020.01.01<br>රු. 37,970/- + ජී. වි. දීමනාව |

**(අ) වයස**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**(ආ) බඳවා ගැනීමේ ක්‍රමවේදය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සිදු කෙරේ.

**(ඇ) පත් වීමේ ස්වභාවය**

ස්ථිර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් සහිතය.

**(ඈ) සෑම ඉල්ලුම්කරුවෙකුම** : -

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
III. බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි කරුවෙකු විය යුතුය.
IV. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.
V. ඉල්ලුම්පත් කැඳවන අවසන් දිනය වන විට බස්නාහිර පළාත තුල වසර 03 ක් අඛණ්ඩ පදිංචිය තහවුරු කල යුතුය.

## අයදුම්පත් එවිය යුතු ආකාරය : -

2020.06.16 දිනට හෝ ඉන් පෙර ලැබෙන සේ සියලු අයදුම්පත් අදාල සහතිකපත් වල පිටපත් සමග ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම්පස අයදුම් කරන තනතුර සඳහන් කල යුතුය.

දැනටමත් රාජ්‍ය දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ සංස්ථාවල සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය. තවද අපේක්ෂකයා තෝරාගනු ලැබුවහොත් මසක කාලයක් ඇතුළත ඔහු සේවයෙන් මුදා හැරිය හැකි බව එම ආයතනයේ ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය.

**සභාපති,**
**තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය ( බස්නාහිර පළාත ),**
**ශ්‍රී සංඝරාජ මාවත,**
**කොළඹ 10.**

www.mytutor.lk

Source: Sent from suriyage.p@itrda.wp.gov.lk (2020.06.02)